# G.C.E. ORDINARY LEVEL

## අ.පො.ස. සාමාන්‍ය පෙළ

**STUDENT SEMINAR SERIES - 2017**

**ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2017**

# GEOGRAPHY

## භූගෝල විද්‍යාව

# QUESTION PAPER - II

## ප්‍රශ්න පත්‍රය - II




**Powered by**

**අධ්‍යාපන අමාත්‍යාංශය**
**ඉ-ඉගෙනුම් හා නැණස අධ්‍යාපනික වැඩසටහන් ඒකකය**
**අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය**
**උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2017**

# භූගෝල විද්‍යාව - II පත්‍රය

| 11 ශ්‍රේණිය | සිංහල මාධ්‍යය | කාලය - පැ. 2 |
|---|---|---|

- මෙම පත්‍රය 1 හා 11 වශයෙන් කොටස් දෙකකින් සමන්විත ය.
- 1 කොටසේ ප්‍රශ්නය අනිවාර්යය වේ. අ, ආ සහ ඉ කොටස් තුනට ම පිළිතුරු සැපයිය යුතු ය.
- 11 කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

සැලකිය යුතුයි.

- I කොටස - අනිවාර්යය වේ. 1 : 50000 භූ ලක්ෂණ සිතියම් විවරණය, ශ්‍රී ලංකා හා ලෝක සිතියම් ලකුණු කිරීමට අදාළ ප්‍රශ්න වේ. මුළු ලකුණු 20කි. ( 1 : 50000 භූ ලක්ෂණ සිතියම් අභ්‍යාසයට ලකුණු 10කි.
- ශ්‍රී ලංකා සිතියම් ලකුණු කිරීමට ලකුණු 05කි. ලෝක සිතියම ලකුණු කිරීමට ලකුණු 05කි. )
- II කොටස - ව්‍යුහගත රචනා ප්‍රශ්න 07කින් සමන්විත වේ. ඉන් 04කට පිළිතුරු සැපයිය යුතුවේ. එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලකුණු 40කි.

## 1 කොටස

1) අ) ඔබ වෙත සපයා ඇති 1 : 50 000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක i සිට v දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න

i) සිතියමේ C අක්ෂරයෙන් දැක්වෙන භූ ලක්ෂණය කුමක් ද ?
( හැඩපලු ගංගාව / ගං දඟරය / ගං මෝය ) (ලකුණු 01)


ii) සිතියමේ A -B රේඛාවෙන් දක්වා ඇති භූ ලක්ෂණය කුමක් ද ?
( උත්තල බෑවුම / නිම්නය / මොහොර ) (ලකුණු 01)

iii) සිතියමේ නැගෙනහිර අර්ධයේ පිහිටි මාර්ගයේ උතුරු සීමාවේ සිට දකුණු සීමාව දක්වා ඇති දුර කිලෝමීටර කණු ඇසුරෙන් ගණනය කරන්න
( කි.මි. 10 කි / කි.මි. 9 කි / කි.මි. 11 කි ) (ලකුණු 01)

iv) E අක්ෂරය සහිත කොටුව තුළ ඇති ජනතාවට පොදු සේවා සපයන ආයතනය සඳහන් කරන්න
( රෝහල / පාසල / පොලිසිය ) (ලකුණු 01)

v) G අක්ෂරය තුළ ඇති සංස්කෘතික ලක්ෂණය කුමක් ද ?
( පාලම / වාරිමාර්ග ඇළ / බෝක්කුව ) (ලකුණු 01)

vi) පහත දැක්වෙන A,B,C හරස්කඩවල් අතුරෙන් X – Y හරස්කඩ දී ඇති හරස්කඩ තුන අතුරෙන් තෝරා ලියන්න (ලකුණු 01)




A B C

vii) 1 : 50 000 සිතියම සඳහා සුදුසු රේඛීය පරිමාණය ඇඳ දක්වන්න (ලකුණු 02)

viii) සිතියම මධ්‍යයේ ඇති චතුරස්‍රයේ වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටරවලින් ගණනය කරන්න (ලකුණු 02)

ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


i) A,B හා C යන අක්ෂර අතුරෙන් මෙක්සිකෝ බොක්ක දැක්වෙන අක්ෂරය කුමක් ද?

ii) D,E හා F යන අක්ෂරවලින් ද්විතියික ජන සංකේන්ද්‍රණ නගරයක් වූ කයිරෝ නගරය දැක්වෙන අක්ෂරය කුමක් ද?

iii) G,H හා J යන අක්ෂරවලින් දැක්වෙන කඳු වැටි තුන අතුරෙන් යූරල් කඳු වැටිය දැක්වෙන අක්ෂරය කුමක් ද?

iv) K,L හා M යන අක්ෂරවලින් දැක්වෙන තැනිතලා අතරින් නල්ලබාර්තැන්න දැක්වෙන අක්ෂරය කුමක් ද?

V) N,O හා P යන අක්ෂරවලින් දක්වා ඇති ගංගා අතරෙන් යෙනිසි ගඟ දැක්වෙන අක්ෂරය කුමක් ද?




(ල. 05)

ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


i) A,B හා C යන අක්ෂර අතුරෙන් ශේෂ කන්දක් වූ සීගිරිය පිහිටා ඇති අක්ෂරය කුමක් ද?

ii) D,E හා F යන අක්ෂරවලින් අධික ලෙස ගංවතුර තර්ජනයට මුහුණ දෙන නිල්වලා ගඟ දැක්වෙන අක්ෂරය කුමක් ද?

iii) G,H හා J යන අක්ෂරවලින් තේ පර්යේෂණායතනය දැක්වෙන අක්ෂරය කුමක් ද?

iv) K,L හා M යන අක්ෂරවලින් දැක්වෙන දූපත් තුන අතරෙන් ඩෙල්ෆ් දූපත දැක්වෙන අක්ෂරය කුමක් ද?

v) N,O හා P යන අක්ෂරවලින් දක්වා ඇති දිස්ත්‍රික්ක තුන අතුරෙන් මොරගහකන්ද ජලාශය පිහිටා ඇති දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 05)




## 11 කොටස

2) i) A කබොල
B භූගත ජලය
C ශාක හා සත්ව ප්‍රජාව
D ඕසෝන් ස්තරය

ඉහත A,B,C,D අක්ෂරවලින් දැක්වෙන දෑ අඩංගු උපපද්ධති වරහන් තුළ දක්වා ඇත. ගැළපෙන පිළිතුර තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න ( වායු ගෝලය / ජල ගෝලය / ශිලා ගෝලය / ජෛව ගෝලය ) (ල. 02)

ii) **ජල චක්‍රය**




a) ඉහත රූප සටහනේ A සහ B ක්‍රියාවලීන් දෙක අනුපිළිවෙළින් සඳහන් කරන්න (ල. 01)
b) මිනිසාට පරිභෝජනයට ගත හැකි ජලය සීමිත ය. එබැවින් ජලය සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න. (ල. 02)

iii) a. ජෛව ගෝලයෙන් මිනිසාට ඇති ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල. 02)

b. මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ජෛව ගෝලයට ඇති වන අහිතකර බලපෑම් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

3) i) ශ්‍රී ලංකා ආර්ථිකයේ කෘෂිකර්මාන්තයට වැඩි වැදගත්කමක් ලැබීමට බලපාන කරුණු දෙකක් සඳහන් කරන්න. (ල. 02)


ii) a. තේ වගාව සඳහා වඩාත් යෝග්‍ය පස් වර්ගය කුමක් ද ? (ල. 01)

b. තේ අපනයනය කරන රටවල් දෙකක් නම් කරන්න. (ල. 02)

iii) a. ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදන ආශ්‍රිත ගැටලුවක් හා කෘෂිකර්මය ආශ්‍රිත පාරිසරික ගැටලුවක් සඳහන් කරන්න. (ල. 02)

b. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය නංවාලීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

4. i) ඔබට සපයා ඇති ලෝක ආකෘති සිතියමේ A,B,C,D, ලෙස නම් කර ඇති ව්‍යාපාරික කිරිපට්ටි පාලනයේ යෙදෙන රටවල් 04ක් නම් කරන්න. (ල. 02)




ii) ව්‍යාපාරික කිරිපට්ටි පාලනය සඳහා අවශ්‍ය කරන්නා වූ

a. භෞතික සාධක එකක්

b. මානව සාධක දෙකක් දක්වන්න. (ල. 03)

iii) a. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කිරිපට්ටි පාලනය සඳහා වයඹ හා දකුණු පළාත්වලට අයත් දිස්ත්‍රික්ක එක බැගින් නම් කරන්න. (ල. 02)

b. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කිරිපට්ටි පාලනය වර්තමානයේ මුහුණපාන ගැටලු දෙකක් පැහැදිලි කරන්න. (ල. 03)

5) i) පහත දැක්වෙන ශ්‍රී ලංකා ආකෘති සිතියමේ 1,2,3,4 ලෙස දක්වා ඇති සංචාරක ආකර්ෂණ කලාප නම් කරන්න. (ල. 02)



ii) a. සංචාරක කර්මාන්තය හා සම්බන්ධ පාරිසරික ගැටලුවක් දක්වන්න.

b. සංචාරක කර්මාන්තයේ ප්‍රවණතා දෙකක් දක්වන්න. (ල. 03)

iii) සංචාරක ව්‍යාපාරය ප්‍රාදේශීය සංවර්ධනයට දායක වේ. ඔබේ අදහස් දක්වන්න. (ල. 05)

6) i) ලෝකයේ ප්‍රධාන ජන සංකේන්ද්‍රණ කලාප දෙකක් නම් කරන්න. (ල. 02)

ii) ප්‍රධාන ජන සංකේන්ද්‍රණ කලාප ඇති වීමට බලපා ඇති සාධක තුනක් ලියා දක්වන්න. (ල. 03)

iii) a. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව වයස් ව්‍යුහය අනුව අධ්‍යයනය කිරීම මඟින් අනාවරණය කරගත හැකි තොරතුරු දෙකක් සඳහන් කරන්න. (ල. 02)

b. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යාප්තිය අසමානතා අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ගයක් විස්තර කරන්න. (ල. 03)

7) i) පහත දැක්වෙන උපද්‍රව වර්ග දෙක සඳහා නිදසුන් එක බැගින් සඳහන් කරන්න.

a) භූ විද්‍යාත්මක උපද්‍රව -

b) දේශගුණික උපද්‍රව - (ල. 02)

ii) ආපදාවක් හා උපද්‍රවයක් අතර වෙනස පැහැදිලි කරන්න. (ල. 03)

iii) ශ්‍රී ලංකාවේ කඳුකර ප්‍රදේශයේ ඇති විය හැකි ස්වාභාවික ආපදා තත්ත්වයක් සඳහන් කර, එවන් අවස්ථාවක ඇති වන බලපෑම් අවම කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

8) i) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම කෙරෙහි බලපාන වායු හතරක් ලියන්න. (ල. 02)

ii) ගෝලීය උෂ්ණත්වය වැඩි වීම නිසා ඇතිවන පාරිසරික ගැටලු තුනක් දක්වන්න. (ල. 03)

iii) A. දේශගුණික විපර්යාස අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න. (ල. 02)

B. ඉන් එක් ක්‍රියා මාර්ගයක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 03)

*******



ඉන්ටනෙට්
සෙල්ලම
දිනක වේදෝ ලෙල්ලන්
නැණවත් අන්තර්ජාල භාවිතය ඔබේ වගකීමකි. ඒ සඳහා හැමවිට
වැඩිහිටි මග පෙන්වීම ලබාගන්න
Dialog
තිරසාරත්ව අංශයේ පණිවිඩයකි